# ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

# කොළඹ

***

## <u>පුවත්පත් නිවේදනය</u>

## මහ කොමසාරිස් කාර්යාලයේ ශ්‍රී ලාංකික සේවක සේවිකාවන් ඇගයේ

මහ කොමසාරිස් කාර්යාලයේ සංවිධානය කරන ලද විශේෂ උත්සවයක දී මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මැතිතුමා විසින් දීර්ඝ කාලයක් මුළුල්ලේ මහත් කැපවීමකින් මහ කොමසාරිස් කාර්යාලයේ සේවය කරන ශ්‍රී ලාංකික සේවක සේවිකාවන් රැසක් අගයන ලදී. වසර 30ක් වැනි දීර්ඝතම කාලයක් මහ කොමසාරිස් කාර්යාලයේ සේවය කරන මාලා ගමගේ මහත්මිය සහ නීල් ජෝසෆ් රෙජිස් මහතා හට ඉන්දියාවට යාමට සහ ආපසු ඒමට ගුවන් ටිකට්පත් ද ඉන්දීය සංචාරය සඳහා විශේෂ මූල්‍ය අනුග්‍රහයක් ද ලබා දෙන ලදී. ශිරානි ශ්‍රීදරන්, සුජාතා හෙට්ටිආරච්චි. නිරංජලා මනෝරි ජෝසෆ් සහ ලක්ෂි සමරවික්‍රම යන මහත්මීන් වෙත ද උසස්වීම් ලබා දෙන ලදී.

2. මහ කොමසාරිස්තුමා, මහ කොමසාරිස් කාර්යාලය වෙනුවෙන් ලබා දෙන අගනා සේවය වෙනුවෙන් ශ්‍රී ලාංකික සේවක සේවිකාවන්ට සිය කෘතඥතාවය පළ කර සිටියේය. මහ කොමසාරිස් කාර්යාලය වෙත ඔවුන්ගේ දායකත්වය, විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ සංවර්ධන සහයෝගීතාවය, සංචාරක කර්මාන්තය, වෙළඳ සහ වාණිජ කටයුතු වැනි ජනතාවට පෘජුවම සම්බන්ධ අංශයන් හි ඉන්දු - ශ්‍රී ලංකා සබඳතා ශක්තිමත් කිරීමේ අරමුණ වෙනුවෙන් ඉවහල් වී ඇති බව මහ කොමසාරිස්තුමා අවධාරණය කළේය.

3. මහ කොමසාරිස් කාර්යාලයේ සේවක සේවිකාවන්ගෙන් 50%ක් පමණ ශ්‍රී ලාංකිකයන් වේ. එසේම, හම්බන්තොට සහ යාපනය ඉන්දීය කොන්සියුලර් ජෙනරාල් කාර්යාලයන්හි මෙන්ම මහනුවර සහකාර මහ කොමසාරිස් කාර්යාලයේ ද කාර්ය මණ්ඩලයෙන් සැලකිය යුතු පිරිසක් දේශීයව බඳවා ගෙන ඇත. එම පිරිස විවිධ සමාජ, භාෂාමය සහ සංස්කෘතික පසුබිම් නියෝජනය කරන අතර එතුළින් පිළිඹිබු වන්නේ ඉන්දියාව සහ ශ්‍රී ලංකාව තුළ පවතින බහුවිධභාවය යි.

***

*කොළඹ*
*2021 දෙසැම්බර් 29*